# සීනිගම දෙවොල් දේවාලය ආශ්‍රිත පලිගැනීම හා සම්බන්ධ අභිචාර විධි පිළිබඳ සමාජ සංස්කෘතික අධ්‍යයනයක්

*දිල්හානි වාසනා ජයරත්න*[1]

ලෞකික දිවි පෙවෙතට අදාළ සංකීර්ණ ගැටලු හමුවේ විසඳුම් සොයන පොදු ජනයා විවිධ අභිචාර විධි කෙරෙහි නැඹුරු වී ඇත. අභිචාරයක් ලෙස හඳුනා ගනුයේ, අධිභෞතික තත්ත්ව පිළිබඳ මිනිසා තුළ ඇති විශ්වාස පද්ධතියකි. මිනිසාගේ යහපත හෝ අයහපත අරමුණු කොට ගනිමින් මිනිසා විසින් ම සිදු කරනු ලබන දෑ අභිචාර ගණයෙහි ලා සැලකේ. පුද්ගල අයහපත කේන්ද්‍ර කොටගත් දුරාභිචාර විධියක් ලෙස පලිගැනීම හා සම්බන්ධ අභිචාර විධි හඳුනාගත හැකි ය. සමාජ සංස්කෘතියෙහි නිරූපිත බොහොමයක් අභිචාර විධි අධිමානුෂික පුද්ගල විශ්වාස හා සම්බන්ධ ව ගොඩ නැගී ඇත. සීනිගම දෙවොල් දෙවියන් ආශ්‍රිත ව පවතින අභිචාර විධික්‍රමය ද එවැන්නකි. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කොළඹ මාතර මහා මාර්ගයේ හික්කඩුව ආසන්න මුහුදු තීරයේ සිට කුඩා දුරකින් මෙම සීනිගම දේවාලය පිහිටා ඇත. ඉන්දියාවේ සිට පැමිණි පත්තිනි දේවිය ඉදිරියේ හාස්කම් පා සීනිගමට ගොඩ බැස්ස බෞද්ධ දේව ගණයට එක් වූ දෙවි කෙනෙකු ලෙස දෙවොල් දෙවියන් හඳුනාගත හැකි ය. මෙම දෙවියන් නූතන ලාංකේය ජනයා අතර විශේෂ ප්‍රසිද්ධියක් උසුලනුයේ, පලිගැනීම් හා සම්බන්ධ අභිචාර විධි සඳහා ය. මෙම පර්යේෂණයේ දී සීනිගම දෙවොල් දේවාලය ආශ්‍රිත පලිගැනීම හා සම්බන්ධ අභිචාර විධි කෙරෙහි වූ නූතන ලාංකේය ජනයාගේ අචල විශ්වාසය පිළිබඳ විමර්ශනයක යෙදීම සිදු කෙරිණි. නූතන ලාංකේය සමාජය තුළ සීනිගම දෙවොල් දේවාලය ආශ්‍රිත ව පවතින පලිගැනීම හා සම්බන්ධ අභිචාර විධි ක්‍රියාත්මක වන්නේ කවරාකාරයෙන් ද යන්න පර්යේෂණ ගැටලුවයි. පර්යේෂණයේ මූලික අරමුණ සීනිගම දෙවොල් දේවාලය ආශ්‍රිත පලිගැනීම හා සම්බන්ධ අභිචාර විධි පිළිබඳ සමාජ හා සංස්කෘතික අධ්‍යයනයක නියැලීමයි. දේවාලයේ පූජා සඳහා සම්බන්ධ වන පුද්ගලයන්ගේ අපේක්ෂා සහ දේවාලය වර්තමාන ජනප්‍රියත්වයට හේතු අධ්‍යයනය කිරීම මෙහි උපඅරමුණු වේ. සම්මුඛ සාකච්ඡා, සහභාගිත්ව නිරීක්ෂණය, පුස්තකාල භාවිතය හා අන්තර්ජාල භාවිතය යනාදි විධික්‍රම ඔස්සේ ඒකරාශී කරගත් දත්ත ගුණාත්මක ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කිරීම පර්යේෂණ ක්‍රමවේදයයි. තත් අධ්‍යයනය මගින් අනාවරණය වූයේ, සෙත් ශාන්තිය පතා දේව පූජාවන්ට සහභාගි වන පිරිස අභිභවා පලිගැනීම හා සම්බන්ධ විවිධ අභිචාර විධි උදෙසා සහභාගී වන පිරිස ප්‍රමාණාත්මක ව අධික බවයි. එහි දී යාදිනි, කන්නලව්, පොල් ගැසීම, පූනා ගැසීම, මිරිස් ඇඹරීම යනාදි පලිගැනීම් හා සම්බන්ධ අභිචාර විධි හඳුනා ගැනිණි. එම අභිචාර විධි ඔස්සේ ඉපැරණි පොදු ජනයාට සාපේක්ෂ ව නූතන ලාංකීය සමාජයෙහි පුද්ගල මනෝභාව දූෂ්‍ය වීමකට ලක් වී ඇති බව හඳුනා ගන්නට වුණි. එසේ හෙයින් මෙම ආගමික සිද්ධස්ථානය වටා ඒකරාශී වන පුද්ගලයන්ගේ පුද්ගල මනෝභාව මෙන් ම දෙවියන් ඇදහීමේ මුඛ්‍ය පරමාර්ථය කාලීන ව විචල්‍යතාවකට ලක් ව ඇති බව මෙම පර්යේෂණ ඔස්සේ නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** සීනිගම දෙවොල් දේවාලය, පලිගැනීම, අභිචාර විධි, සමාජ සංස්කෘතික අධ්‍යයනය, පොදු ජනයා

[1] සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය, පේරාදෙණිය. g.dilhaniwasana@gmail.com